**තමන්කඩුව ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 23 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**

**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිඟහිටි උසාවි දඩ ශේෂය රු. 500,000 ක් මූල්‍ය ප්‍රකානවලින් අත්හැරී තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර . රු.152,135,811 ක් වූ පැහැදිලි නොකළ වෙනසක් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගලික සමාගමකින් අයවිය යුතු රු. 1,870,710 ක්වූ වැලි ප්‍රවාහන බලපත්‍ර ආදායම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 363,243 ක්වූ ගෙවිය යුතු බිල්පත් 14 ක් වෙනුවෙන් වූ වියදම මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) රෝද හතරේ ට්‍රැක්ටර් රථයක වටිනාකම තක්සේරු කර, මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ වැඩ නිමකර තිබුණු ප්‍රතිචක්‍රීයකරණය කළහැකි අපද්‍රව්‍ය ගබඩාවේ වටිනාකම වූ රු. 1,608,393 ක්, කසල ප්‍රතිචක්‍රීයකරණ ඒකකය නවීකරණය කිරීම සඳහා වැයකර තිබුණු රු. 2,236,420 ක් හා පොළොන්නරුව වටරවුම අසල කඩ කාමර සහිත වානිජ ගොඩනැගිල්ලෙහි වටිනාකම වූ රු.5,586,371 ක් වශයෙන් වූ වියදම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 108,528,944 ක් වූ අතර එයින් රු. 22,591,067 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එන ශේෂයන් විය. සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 53,326,213 ක් වූ අගය තුළ වර්ෂ 5 කට වැඩි රු. 2,045,934 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි.

1.3.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------------

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 132(ඒ) වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව අවස්ථා 12 කදී නීතිමය ප්‍රතිපාදන සළසා නොමැති විෂයයන් සඳහා රු.317,405 ක් වැයකර තිබුණි. |
| (ii) | 150(1) , 152(1)හා 153(1) වගන්ති | කර්මාන්ත, වෙළද ව්‍යාපාර හා වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳ වූ ලැයිස්තු ආදායම් පරීක්ෂක, ආදායම් පරිපාලක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද්දා වූ නිලධාරියෙකු විසින් පිළියෙල කර, වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | චක්‍රලේඛ හා ලිපි | |
| | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | අවම වශයෙන් වසර 05 කට වරක් කඩ කුලි සංශෝධනය කළයුතු වුවද සභාව සතු කඩ කාමර 240 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු නොකර පදනමකින් තොරව කුලි අයකර තිබුණි. අවසන් වරට කඩකුලී සංශෝධනය කර තිබුණේ 2008 වර්ෂයේදීය. |

02. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,972,672 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,278,191 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---------------------

2.2.1 කඩ කාමර බදු

------------------

(අ) සභාව සතු කඩ කාමර බදුදීමේදි ගිවිසුම ප්‍රකාරව ටෙන්ඩරය පිළිගත් දින සිට දින 14 ක් ඇතුළත එක්වන් මුදල් ගෙවා අවසන් කළයුතු වුවද, කඩ කාමර 28 කින් එලෙස ලැබිය යුතු රු. 1,673,991 ක මුදල් වසර 10 කට අධික කාලයක සිට හිඟ හිට තිබුණි.

(ආ) ගිවිසුම් ප්‍රකාරව නියමිත කඩකුලි නොගෙවන අවස්ථාවලදි කුලි ගිවිසුම් අහෝසි කර අදාල කඩ කාමර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතු වුවත්, එසේ කටයුතු නොකරන ලද කඩ කාමර 85 කින් ලැබිය යුතු රු. 737,523 ක හිඟ කඩකුලි වර්ෂ 04 ක සිට අයකරගෙන නොතිබුණි.

(ඇ) පොළොන්නරුව රෝහල හන්දියේ තිබෙන සභාව සතු කඩ කාමර 36 ක් සදහා වු කුලී ගිවිසුම් වර්ෂ 20 ක කාලයක් ඉක්මවා තිබූ අතර, එම කඩ කාමර සඳහා වූ නව ගිවිසුම්වලට ඇතුළත්වීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) කදුරුවෙල බස්නැවතුම්පලේ පිහිටි කඩ කාමර දෙකක් මුල් බදුකරුවන් විසින් සභාවේ අනුමැතියකින් තොරව අතුරු බදු දි තිබුණි. එම කඩ කාමර දෙකෙහි වු ගිවිසුම් අවලංගු කිරීමට හෝ අතුරු බදු දීම් වෙනුවෙන් බදුකරුට එරෙහිව කටයුතු කිරීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

(අ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස සදහා වෙන්කළ රු. 2,000,000 ක් වූ ප්‍රතිපාදන රේඛීය අමාත්‍යාංශයෙන් ලබාගෙන අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට සභාව අපොහොසත්වී තිබුණි.

(ආ) එකතුව රු.1,034,287 ක් වූ බැංකු ජංගම ගිණුම් තුනක ශේෂයන් වර්ෂ කිහිපයක සිට අක්‍රීයව පැවතුණි.

(ඇ) සභාවේ ආදායම් රැස්කරන නිලධාරින් 15 දෙනෙකු වෙත 2013 සිට 2015 අතර කාල පරිච්ඡේදය තුළ නිකුත් කර තිබුණු ලදුපොත් 29 ක උපපත්‍රිකා 2016 මාර්තු 15 දින වන විටත් ආපසු භාරදිමට කටයුතු කර නොතිබුණු අතර එම තත්ත්වය පිළිබද නොසලකා නිලධාරින් වෙත නැවත ලදුපොත් නිකුත් කර තිබුණි. එමෙන්ම සභාවෙන් පිටත වෙනත් ආයතන වෙත ස්ථානමාරුවී ගිය හා විශ්‍රාමගිය නිලධාරින් 5 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු ලදුපොත් 9 ක් ආපසු ලබාගෙන නොතිබුණි.

(ඈ) වසර 03 කට අධික කාලයක සිට නිශ්කාර්යව පැවති කදුරුවෙල නගර මධ්‍යයේ පිහිටි ඉඩම් කැබැල්ලක් වසර 02 ක කාලයකට බදුදීම සදහා ටෙන්ඩර් කැඳවා එම ඉඩම බදුදීමකින් තොරව අවලංගු කර අදාල ටෙන්ඩර් ගාස්තු ආපසු ගෙවා තිබුණි

(ඉ) රු.35,000 ක මාසික කුලියකට ලබාදී තිබුණු සභාව සතු ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරිම සදහා පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර වර්ෂ 3 කට අධික කාලයක් ගතව තිබුණුද නව ගොඩනැගිල්ල ඉදිනොකිරීම නිසා සභාවට මාසිකව උපයාගත හැකිව තිබූ විශාල ආදායමක් අහිමිවී තිබුණි.

3.2 බලය නොලත් ගණුදෙනු

---------------------------

ඉකුත් වර්ෂවලට අදාල රු. 19,638,834 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂ 04 ක් සහා අනුමැතියකින්තොරව සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනකට එකතු වන කසල ටොන් 9 - 10 ක් පමණ ප්‍රමාණයක් සභාවේ කම්කරුවන් හා ට්‍රැක්ටර් යොදවාගෙන ගල්ලෑල්ලේ පිහිටි සභාව සතු අක්කර 05 ක පමණ භූමියට බැහැර කර තිබුණි. එලෙස එකතුවන කසල වලින් සියයට 4.8 ක් පමණ කොම්පෝස්ට් සෑදීමටත් සියයට 1.2 ක් පමණ ප්‍රතිචක්‍රියකරණය සඳහාත් යොදා ගෙන තිබුණි. ඉතිරි කසල සම්පූර්ණයෙන්ම එම භූමියේ විවෘතව බැහැර කිරීම නිසා සභාව විසින් විධිමත් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයකට යොමුවී නොමැති බවත්, එමගින් විශාල පාරිසරික ගැටළු රාශියකට මුහුණපෑමට සිදුවි ඇති බවත් නිරික්ෂණය විය. තවද එසේ විවෘතව බැහැර කළ කැළි කසල පස්දමා වැසීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි අවස්ථා 3 කදී රු. 1,377,160 ක මුදලක් වැයකර තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ගිනි නිවන ඒකකයේ මූලික ගිනිභට 03ක්ද, යාන්ත්‍රික ගිනිභට 15 දෙනෙක්ද වශයෙන් පුරප්පාඩු 18 ක් පැවතුණු අතර සභාව තුළ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරින් 22 දෙනෙකු විධිමත් අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණි. සභාවේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය නිවැරදිව හඳුනාගෙන අනුමත කර ගැනීමට කටයුතු නොකිරීම නිසා සේවකයින් බඳවා ගැනීම සහ සේවයේ යොදවා ගැනිම නිසි ක්‍රමවේදයකට සිදුවී නොතිබුණි

04. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---------------------------------------

4.1 ක්‍රියාකාරි සැලැස්ම

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව ප්‍රාදේශීය සභා පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

------------------------

සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් රු.127,948,668 ක ආදායම් හා රු. 98,975,999 ක වියදම් දරා තිබුණු නමුත්, මෙම ගණුදෙනු සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර විගණන පරික්ෂාවක් සිදුකිරිම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරිම

----------------------------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(i) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

-------------------------------

(අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------------

රු. 12,851,871 ක් වටිනා වත්කම් විෂයයන් 8ක් වර්ෂ 2 සිට 20 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ආ) වාර්ෂික සමීක්ෂණය

------------------------

1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 218 පරිදි සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණයට ලක්කළ යුතු වුවත් සභාව විසින් එවැනි සමීක්ෂණයක් සිදුකර නොතිබුණි

(ඇ) බාහිර පාර්ශවයන් විසින් පාවිච්චි කරන වත්කම්

-----------------------------------------------------

රු. 738,000 ක් වටිනා ගල්තඹරාව පුස්තකාල ගොඩනැගිල්ල ගාස්තු අයකර ගැනීමෙන් තොරව තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට සේවා පියසක් පවත්වාගෙන යාමට ලබාදී තිබුණි

(ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරිම

----------------------------------------------------------------

(i) මුලා‍ය ප්‍රකාශනවල ඉඩම් ගොඩනැගිලි යටතේ දක්වා තිබෙන ඉඩම් කැබලි 76 සඳහා ප්‍රාදේශීය සභාව නමින් ඉඩම් ඔප්පු හෝ හිමිකම් සහතික පත්‍ර ලබාගෙන අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) සභාව විසින් භාවිතයට ගන්නා වාහන 6 ක ලියාපදිංචි සහතික සභාව නමින් පවරා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(iii) ඉඩම් 12 ක අයිතිය තහවුරු කර ගැනිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලබාගත යුතු රජයේ ඉඩම් පිළිබඳ සහතික ලබාගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි

05. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේ ෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය

(ඉ) වත්කම් කළමනාකරණය

(ඊ) වාහන පරිපාලනය